# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2052/28 – 2018 ජනවාරි 05 වැනි සිකුරාදා – 2018.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරළේ සුළු කොට්ඨාසයේ, පානළුව ගමේ පිහිටි, කොළඹ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එච්එම්ජී/2015/596 හා 2015.12.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 01 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 13.4832 ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – අත්තනපොලවත්ත – ප්‍රමාණය: හෙක්. 13.4832**

උතුරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොට්ටනේ ලන්ද, ඇළ සහ පාර; නැගෙනහිරට: පාර, මාර්ගය, විතානගේ ලීලාවතී හිමිකම් කියන අත්තනපොලලන්ද, සීමන්සිංඤෝ හිමිකම් කියන අත්තනපොලලන්ද, කේ.ආනන්ද හිමිකම් කියන අත්තනපොලලන්ද, පාර, දීපිකා කුමාරගේ හිමිකම් කියන අත්තනපොලලන්ද සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොට්ටනේලන්ද; දකුණට : මාර්ගය, විතානගේ ලීලාවතී හිමිකම් කියන අත්තනපොලලන්ද, සීමන්සිංඤෝ හිමිකම් කියන අත්තනපොලලන්ද, කේ. ආනන්ද හිමිකම් කියන අත්තනපොලලන්ද, පාර, දීපිකා කුමාරගේ හිමිකම් කියන අත්තනපොලලන්ද සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොට්ටනේලන්ද; බටහිරට : හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොට්ටනේලන්ද සහ ඇළ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2014/ආර්පීආර්/428.
2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01-561